# ජාතික අධ්‍යාපන ආයතනය

## අධ්‍යාපනික තක්සේරුව සහ ඇගයීම පිළිබඳ ඩිප්ලෝමා පාඨමාලාව

## Diploma in Educational Assessment and Evaluation

(2025/2026)

ජාතික අධ්‍යාපන ආයතනයේ විභාග දෙපාර්මේන්තුව මගින් මෙහෙයවනු ලබන උක්ත පාඨමාලාව සඳහා අයදුම්පත් කැඳවනු ලැබේ.

**පාඨමාලවේ ස්වභාවය**

විභාග/පරීක්ෂණ සැලසුම් කිරීම, සංවිධානය කිරීම, ප්‍රශ්න පත්‍ර සකස් කිරීම, පිළිතුරු පත් ඇගයීම හා ප්‍රතිඵල විශ්ලේෂණය වැනි කාර්යන් හි නිරතවන අධ්‍යාපන ක්ෂේත්‍රයේ නිලධාරීන්ට වැදගත් වන, ශ්‍රී ලංකා සුදුසුකම් රාමුවේ (Sri Lanka Qualification Framework) තෙවන මට්ටමේ (SLQF Level 03) පාඨමාලාවකි.

**පාඨමාලාවේ අන්තර්ගතය**

1. මිනුම, තක්සේරුව හා ඇගයීම පිළිබඳ භාවිත (Applications of Measurement, Assessment and Evaluation)
2. පරීක්‍ෂණ තැනීම හා විශ්ලේෂණය (Test Constructions and Analysis)
3. පරීක්ෂණ/විභාග පරිපාලනය (Test Administration)
4. තක්සේරු හා ඇගයීම් උපකරණ තැනීම (Developing tools for Assessment and Evaluation)
5. අධ්‍යාපනික සංඛ්‍යානය සහ සංඛ්‍යානමය මෘදුකාංග භාවිතය (Practices of Educational Statistics and Statistical Software)

**අවශ්‍ය සුදුසුකම්**

1. අ.පො.ස. උසස් පෙළ විභාගයෙන් එකවර විෂයයන් 03ම සමත් වී තිබීම

**සහ**

2. රාජ්‍ය/අර්ධ රාජ්‍ය/පුද්ගලික/ජාත්‍යන්තර පාසලක, පිරිවෙනක හෝ වෙනත් අධ්‍යාපනික ආයතනයක ගුරුවරයෙකු වීම

**හෝ**

රාජ්‍ය/අර්ධ රාජ්‍ය/පුද්ගලික/ජාත්‍යන්තර පාසලක, පිරිවෙනක හෝ වෙනත් අධ්‍යාපනික ආයතනයක විදුහල්පතිවරයෙකු වීම

**හෝ**

ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවයේ/ගුරු උපදේශක සේවයේ නිලධාරියෙකු වීම

**හෝ**

ශ්‍රී ලංකා ගුරු අධ්‍යාපනඥ සේවයේ හෝ ජාතික අධ්‍යාපන ආයතනයේ අධ්‍යයන කාර්ය මණ්ඩලයේ නිලධාරියෙකු වීම

**සහ**

2024.12.31 දිනට වයස අවුරුදු 50 ට අඩු වීම

| | |
|---|---|
| **කාලසීමාව** | - එක් අවුරුදු පාඨමාලාවකි (සති අන්ත සහ පාසල් නිවාඩු දින) |
| **මාධ්‍යය** | - සිංහල/ දෙමළ |
| **දේශන පැවැත්වීම** | - **සම්මුඛ සැසි (Contact Sessions) 75%** ක් හා **මාර්ග ගත ක්‍රමයට (Online) 25%** ක් ලෙස පැවැත්වේ |
| **තෝරා ගැනීමේ පදනම** | - ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක් මගින් හෝ ලිඛිත පරීක්‍ෂණයක් සහ සම්මුඛ පරීක්‍ෂණයක් මගින් හෝ ඉහළම සුදුසුකම් සපුරා ඇති අයදුම්කරුවන් තෝරා ගනු ලැබේ. |
| **පාඨමාලා ගාස්තුව** | - රු. 50,000/- |
| **ලියාපදිංචි ගාස්තුව** | - රු. 2,000/- |
| **ඉල්ලුම්පත්‍ර සඳහා ගාස්තුව** | - රු. 1,200/- (ආපසු ගෙවනු නොලැබේ.) |

**අයදුම් කළ යුතු පිළිවෙළ**

ඉහත සඳහන් සුදුසුකම් සපුරා ඇති අයදුම්කරුවන්,

- ජාතික අධ්‍යාපන ආයතනයේ විභාග දෙපාර්තමේන්තුවේ නිල වෙබ් අඩවියට පිවිස https://www.exams.nie.lk/intakes/new යොමුව ඔස්සේ මාර්ගගතව පමණක් අයදුම්පත් යොමු කළ යුතු ය. මාර්ගගතව අයදුම්පත් යොමු කිරීම සම්බන්ධයෙන් අවශ්‍ය උපදෙස් පහත යොමුව මගින් ලබා ගත හැක (https://www.exam.nie.lk/info/applying-for-new-enrollments)
- අවසානයේ සම්පූර්ණ කරන ලද අයදුම්පත බාගත (download) කර විදුහල්පති/කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ/ආයතන ප්‍රධානියාගේ නිර්දේශය ඇතිව ඕනෑම මහජන බැංකු ශාඛාවක ඇති ජාතික අධ්‍යාපන ආයතනය තැන්පතු පත්‍රිකාව භාවිත කර රු. 1,200ක මුදලක් තැන්පත් කර එහි රිසිට්පත අයදුම්පතෙහි අලවා ඔබගේ නම, ලිපිනය සහිත රු.110.00ක මුද්දර ඇලවූ 9" x 4" ප්‍රමාණයේ ලියුම් කවරයක් සමග **"පාඨමාලා සම්බන්ධීකාරක, විභාග දෙපාර්තමේන්තුව, ජාතික අධ්‍යාපන ආයතනය, මහරගම"** යන ලිපිනයට **2024 දෙසැම්බර් මස 31** වන දිනට හෝ එදිනට පෙර ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. ලියුම් කවරයේ වම්පස ඉහළ කෙළවර **"DEAE- 2025/2026"** යනුවෙන් සඳහන් කළ යුතු ය.

අධ්‍යක්ෂ ජනරාල්
ජාතික අධ්‍යාපන ආයතනය
මහරගම

**අයදුම්පත් එවිය යුතු පිළිවෙළ**

1.0 අයඳුම්පත් සම්පූර්ණ කළ යුතු ආකාරය https://www.exams.nie.lk/intakes/new වෙබ් අඩවියට ඇතුළත් වී (Sign up) අදාළ තොරතුරු සම්පූර්ණ කරන්න. (Sign up) සම්බන්ධයෙන් අවශ්‍ය උපදෙස් පහත යොමුව මඟින් ලබාගත හැකිය. https://www.exams.nie.lk/info/register-as-a-user පරිශීලක අංකය (User ID) සටහන් කර ගන්න. අවශ්‍ය ඉදිරි කටයුතු සඳහා මුරපදය (Password) මතක තබා ගන්න.

2.0 වෙබ් අඩවියේ දකුණු පස ඉහළ දක්වෙන කොටු දෙකෙහි පරිශිලක අංකය හා මුරපදය යොදා ඇතුළත් වන්න. (Log in)

2.1 ඔබ පිළිබඳ තොරතුරු පත්‍රිකාව **(User Profile)** යාවත්කාලීන **(Update)** කරන්න.

- පෞද්ගලික තොරතුරු
- සේවා තොරතුරු
- අධ්‍යාපන හා වෘත්තීය සුදුසුකම්

2.2 අනතුරුව https://www.exams.nie.lk/newintakes **Diploma in Educational Assessment and Evaluation 2025/2026** පාඨමාලාවට තෝරා ගන්න.

2.3 අනතුරුව **My application** තෝරා ගන්න. තොරතුරු නිවැරදිව ඇතුළත් කර එය නැවත පරීක්ෂාකර අයදුම්පත්‍ර යොමු කරන්න. අවශ්‍ය උපදෙස් පහත යොමුව මඟින් ලබාගත හැකිය. https://www.exams.nie.lk/applying-for-new-enrollments

2.4 ඔබට ලැබෙන අයදුම්පත් පරිශීලක අංකය **(Application Reference Number)** සටහන් කර තබා ගන්න.

3.0 අයදුම්පත බාගත කිරීම **(Download Application)**

මාර්ගගත (Online) අයඳුම්පත සම්පූර්ණ කිරීමෙන් පසුව ඔබේ යොමු අංකය **(Reference Number)** සමඟ ලැබෙන විස්තර ඇතුළත් පිටපත මුද්‍රණය කර එය ආයතන ප්‍රධානියා මගින් සහතික කරවා ගෙන අයඳුම්පත් ගාස්තුව සඳහා මුදල් ගෙවන ලද රිසිට් පතෙහි මුල් පිටපත සහ පහත සඳහන් ලේඛනවල සහතික කරන ලද පිටපත් සහිතව, පාඨමාලා සම්බන්ධීකාරක, විභාග දෙපාර්තමේන්තුව, ජාතික අධ්‍යාපන ආයතනය, මහරගම ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතු ය.

1. අධ්‍යාපන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) සහතික ප්‍රතිඵල
2. පත්වීමේ ලිපිය
3. සේවා සහතිකය

ඔබගේ ලේඛන බහා එවන කවරයේ වම්පස උඩ කෙළවරේ **DEAE 2025/2026 (Sinhala)** යනුවෙන් සඳහන් කළ යුතු ය.

4.0 වැඩිදුර විස්තර සඳහා සිංහල මාධ්‍ය පාඨමාලා සමායෝජක ඊ.එම්.වයි සචිත් මයා (0117601693) දෙමළ මාධ්‍යය පාඨමාලා සාමයෝජක පී.ඒ.හේරත් මිය (0117601767) තාක්ෂණික සහාය සඳහා මාධව තෙන්නකෝන් මයා 0117601777, 0117601776 දුරකථන අංකවලට සතියේ දිනවල පෙ.ව. 9.00 සිට ප.ව. 4.00 දක්වා අමතන්න. අයඳුම්පත් බාර ගැනීමේ අවසන් දිනය 2024.12.31 වේ.

අධ්‍යක්ෂ ජනරාල්
ජාතික අධ්‍යාපන ආයතනය
මහරගම.